ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය / உமது இல / Your No.

අපේ අංකය / எமது இல. / Our No.

දිනය / திகதி / Date

2020 අප්‍රේල් 11

අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු පැවරෙන විදුලිකාර්මිකයින්/ජලනල කාර්මිකයින් හා ගෘහ විදුලි උපකරණ හා වායුසමීක්රණ නඩත්තු ශිල්පීන් සඳහා වූ මාර්ගෝපදේශ. මෙම අත්‍යවශ්‍ය සේවාවේ අරමුණ නිවැසියන්ට අඛණ්ඩ විදුලි හා ජල සැපයුමක් සහතික කිරීමයි

1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (1939), ලංකා විදුලි බල මණ්ඩලය (1987), ලංකා විදුලි පුද්ගලික සමාගම (1910) හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (0764271030) දුරකතන වලට ඉදිරිපත් කෙරෙන විදුලි හෝ ජල පාරිභෝගිකයෙකුගේ ඉල්ලීමක් මත ඔබ සඳහා අත්‍යවශ්‍ය නඩත්තු කටයුත්තක් පැවරෙනු ඇත.
2. අදාල විදුලි හෝ ජල පාරිභෝගිකයාගේ පරිශ්‍රයට ආසන්නතාවය මත තාක්ෂණික ශිල්පියා තෝරාගැනීමට සැම විටම ඉහත ආයතන පියවර ගනු ඇත
3. ඔබට අත්‍යවශ්‍ය නඩත්තු කටයුත්තක් පැවරුණ පසු ආසන්නතම පොලිස් ස්ථානයෙන් අවශ්‍ය ඇඳිරි නීති බලපත්‍රය ඉල්ලුම් කල හැකි ය.
4. ඔබට ආසන්න පොලිස් ස්ථානයේ හා ස්ථානාධිපති වරයාගේ දුරකතන අංක www.police.lk වෙබ් අඩවියට පිවිස ලබාගත හැකි ය.
5. ඔබ විසින් සැම නඩත්තු කටයුත්තකදීම අදාල ඇඳිරි නීති බලපත්‍රයේ කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතු වේ.
6. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති කොරෝනා වසංගතයට අදාල සෞඛ්‍යමය නිර්දේශ ද අනිවාර්යෙන් අනුගමනය කල යුතු වේ.
7. සේවාව ලබාදුන් පසු ඔබ විසින් සාධාරණ ගාස්තුවක් පාරිභෝගිකයාගෙන් අයකල හැකිය. ගාස්තු සම්බන්ධයෙන් කලින් එකග වන ලෙසද දන්වා සිටිනු ලැබේ.
8. ඔබ විසින් අයකරන ගාස්තුව සඳහා ලදුපතක් නිකුත් කල යුතු ය.
9. අදාල තාක්ෂණික ශිල්පීන්ගේ තොරතුරු ගොනුවක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන අතර අවශ්‍යතාවය අනුව යාවත්කාලීන කෙරෙන එම තොරතුරු ගොනු අදාල ආයතන වෙත හා මහජනතාව වෙත නිකුත් කෙරේ.
10. මෙම කොන්දේසි ද අවශ්‍යතාවය අනුව සංශෝධනය කරනු ලැබිය හැකි අතර එවැනි සංශෝධන පිළිබඳ ඔබ වෙත දන්වා එවනු ලැබේ

- **වැඩිදුර තොරතුරු සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිල ෆේස් බුක් පිටුවට පිවිසෙන්න Facebook/pucsl**

06 වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 26, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව. | 06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03, இலங்கை. | Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8 Fax : +94 11 2392641 E-mail : info@pucsl.gov.lk Web : www.pucsl.gov.lk

සභාපති / தலைவர் / Chairman +94 11 2392604

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General +94 11 2392606